# පුරාතන ලෝක පුස්තකාල ක්‍රමයේ ආසියානු ලකුණ

එච්.එම්. ඉසුරු හේරත්[1]

## හැඳින්වීම

පුරාතන යුගයේ සිට වර්තමානය දක්වා වූ දීර්ඝතර විශ්ව මානව දැනුම වර්තමාන පරපුරෙන්, අනාගත පරපුරෙන් පරිශීලනය සඳහා සුරක්ෂිත කරන ස්ථානයක් වශයෙන් පුස්තකාලයට හිමිවන්නේ විශිෂ්ට ස්ථානයකි. විශේෂයෙන්ම පාඨකයින්ගේ භාවිතය සඳහා මුද්‍රිත සහ මුද්‍රිත නොවන මාධ්‍ය සංවිධානාත්මකව එක්රැස් කොට තිබෙන ස්ථානය පුස්තකාලය යනුවෙන් සරලව හඳුනාගත හැකි ය (මුතුකුඩ, ජයසුන්දර,2014:23). වර්තමාන පුස්තකාලයේ කාර්යභාරය වන්නේ,

- පාඨකයන් සඳහා තොරතුරු මූලාශ්‍රය තෝරාගෙන එක්රැස් කිරීම.
- පාඨකයන් සඳහා තොරතුරු මූලාශ්‍රය සංවිධානය කිරීම.
- පාඨකයන් සඳහා තොරතුරු සේවා සැපයිම.
- තොරතුරුවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා පාඨකයින්ට මග පෙන්වීම සහ සංරක්ෂණය යනාදියයි.

එවන් හුදු මහත් කාර්යයක් කරන පුස්තකාලය ස්වයං අධ්‍යාපනය සඳහා ඇති ක්ෂේම භූමිය යනුවෙන් එස්. ආර්. රංගනාදන් මහතා හැඳුන්වන්නේ එබැවිනි.

මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ ගෝලිය පුස්තකාල ඉතිහාසයට ආසියාවෙන් ලැබුණු ආලෝකය කෙසේදැයි පරීක්ෂා කිරීමය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව කිසඳු විද්වතෙකු ගැඹුරින් අධ්‍යයනය නොකළද මර්වින් රණසිංහ වැනි උගතුන් ප්‍රස්තුත ක්ෂේත්‍ර පිළිබඳ ව සුළුවෙන් විමර්ශනය කළද එය අසම්පූර්ණ වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පුරාතන ගෝලීය පුස්තකාල ඉතිහාසයේ ආසියාවට හිමි ස්ථානය හඳුනා ගැනීමය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදි. ඒ අනුව ප්‍රාථමික සහ ද්විතීයික දත්ත මනාව විශ්ලෙෂණය කරමින් නිගමනය කරා එළැඹිණි.

1. සහකාර පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. isuruhistory@gmail.com

**සාකච්ඡාව**

වර්තමාන ලෝකයේ දියුණු මට්ටමේ පුස්තකාල වැඩි වශයෙන් හමුවන්නේ ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ජපානය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව, චීනය, කැනඩාව, ස්පාඤ්ඤය, පෘතුගාලය, රුසියාව, බ්‍රසීලය යනාදි රටවලය. උක්ත රටවල පිහිටි පුස්තකාල සමහරක් පහත දැක්වෙයි.

| | | | | |
|---|---|---|---|---|
| ලන්ඩන් | හාවර්ඩ් | මැසචුසෙන්ට් | මෝනැෂ් | බීජින් |
| කේම්බ්‍රිජ් | ප්‍රින්ස්ටන් | ටෝකියෝ | දිල්ලි | කැන්බරා |
| ඔක්ස්ෆර්ඩ් | චිකාගෝ | ෂුකුටෝකු | මද්‍රාසි | බ්‍රසීලියා |
| සොබෝන් | නිව්යෝර්ක් | කොයිම්බ්‍රා | වූහාන් | පාඩුවා |
| ලිස්බන් | මැඩ්රිඩ් | බර්ලින් | ලෙනින්ග්‍රාඩ් | මොස්කව් |

උක්ත දියුණු පුස්තකාල අතුරින් බොහෝමයක් අයත් වන්නේ අපරදිග සංවර්ධිත රටවලය. එහෙත් ලෝකයෙ ප්‍රථම පුස්තකාල ක්‍රමයට අඩිතාලම දමන්නේ අපගේ මාතෘභූමිය අයත්වන ආසියාවට බව ආඩම්බරයෙන් සඳහන් කළ හැකි ය. එනම් ක්‍රි. පූ. 2600 සියවසේ වර්කා නම් දේවාලයක කුඤ්ඤ අක්ෂරයෙන් ලියන ලද මැටි පුවරු ලිපි රාශියක් හමුවීමත් සමඟය. එසේ ම අවසාන ඇසිරියානු වැදගත් පාලකයා වන අසුර බනිපාල් විසින්  මීට වසර 2700 මැටි පුවරු ලිපි 30.000 යුත් ලොව ප්‍රථම සැලසුම්ගත පුස්තකාල නිර්මාණය කරවන ලදි. ක්‍රි. ව. 570 පසුව මැද පෙරදිග .උමයාඩ්, සරසන්, ෆට්මඩ්, මම්ලුක් යන අරාබින් සතුවද පුස්තකාල පැවතින. මෙම අරාබි පුස්තකාලවල ග්‍රීක, රෝම, ඊජිප්තු අරාබි, ඉන්දීය ජාතියට අයත් ලේඛන ද්‍රව්‍ය තැම්පත්කොට පැවතිනි. ලොව පැරණිතම පුස්තකාය වගේම දෙවැනියට ලොව පැරණිතම පුස්තකාලය හමුවන්නේ ද නැගෙනහිර ආසියාවෙනි. එනම් ක්‍රි. පු. 1500 චීන ශිෂ්ටාචාරයෙ පුස්තකාල ක්‍රමය ආරම්භ විය (මාගම්මන,2 005:37). ෂැන්ග්, හන්, ටැං රජවරු රාජකීය වාර්තා එක්රැ ස් කිරීම, ගබඩා කිරීම රාජවංශ තොරතුරු වාර්තාකොට මතු පරපුරෙ භාවිතය සඳහා රාජකීය පුස්තකාල පවත්වාගෙන ගියහ. විශේෂයෙන්ම ලොව පැරණිම පුස්තකාල ක්‍රමයක් ලොවට දයාද කළේ චීනුන් ලොව ප්‍රථම ප්‍රාථමික මුද්‍රණ ක්‍රම, කඩදාසි සොයා ගත් අයවලුන් බව අපි අමතක නොකරමු. පෙර සඳහන් කළ පරිදි පෙර අපරදිග මිනිසා ස්වකීය ලේඛනාශ්‍රිත සන්නිවේදන කටයුතුවලදී මාධ්‍ය වශයෙන් ,සත්ව අස්ථි කොටස්, පැපිරස් පොත්,පුස්කොළ පොත්, මැටි පුවරු, ශිලා පුවරු, තඹ පලක, සේද රෙදි, යනාදිය ප්‍රයෝජනයට ගත් බව පෙනේ. එහෙත් වඩාත් පිරිසිදු කාර්යක්ෂම ක්‍රමවේද සහිත මුද්‍රණ ශිල්පයක් සොයා ගැනීමෙහිලා විශාල කාර්යභාරයක් ඉටු කොට ඇත්තේ චීනුන් විසින් පැවසීම සාධාරණය. විශේෂයෙන්ම චීනයේ හෝති අධිරාජයාගේ රාජ සභාවේ විසූ සායිලුන් (Tsaeilum) නැමැති රාජකීය අන්තඃපුර නිලධාරියා විසින් ක්‍රි.පූ 105 දී ප්‍රථම වරට සේද කඩමාලු, මල්බෙරි, ශාකපත්‍ර, හණ සහ පත් වර්ග භාවිතා කරමින් කඩදාසිය (ෂ්චැර) නිපදවා ලොවට දායාද කරන ලදි (සෙනරත් , 2001፡ 03). එබැවින් මුද්‍රණ ශිල්පයේ විශාල කොටස් ආවරණය වන කඩදාසිය ලෝකයට හඳුන්වාදීමේ ගෞරවය පැරණි චීනයට හිමි වන බව කිව යුතු ය. එහෙත් කඩදාසිය සඳහා භාවිත කරන පේපර්

නැමැති ඉංග්‍රීසි පදය පැපිරස් යන්නෙන් නිපන් එකකි. ප්‍රථමයෙන් ඔවුහු උණ පතුරු වල හා ජේඩ් ගල්වල සංකේත කොටා එකී මුද්‍රාමත වර්ණ ගල්වා කඩදාසි ආදේශක මත තැබූහ. මෙම ක්‍රමවේදය ශ්‍රේෂ්ඨ කවින් වංශික චීන අධිරාජ්‍යය චින පී හුවාන්ගේ (Ching pe Huang) ක්‍රි.ව.146-200 රාජ සභාවෙන් නිකුත් කෙරෙන අණ පනත් සහ අනෙකුත් ලිපි ලේඛනවල රාජකීය ලාංඡනය කැබීම සඳහා භාවිත කළේය. එහෙත් චීන අධිරාජ්‍යය විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්තව තිබීම නිසා බොහෝ විට ආක්‍රමණ, අභ්‍යන්තර කැරළි කෝලාහල හා ස්ථාන මාරුවීම් වැනි රාජ්‍ය පරිපාලනමය ගැටලු පැන නැගිණ, ඒවාට විසඳුම් සෙවීම සඳහා අවැසි රාජකීය නියෝග රැගත් පණිවිඩ වේගයෙන් හුවමාරු කර ගැනීමටත් සහ විශාල නිලධාරින් පිරිසකගේ අතට රාජකීය නියෝග පත්කිරීමට සුදුසු පිටපත් විශාල සංඛ්‍යාවක් ලබා දිය හැකි වෙනත් මුද්‍රණ ක්‍රම ශිල්ප සෙවීමට චීන ජාතිකයෝ උත්සහ දැරුහ (අබේසිංහ, 2007:16). එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව.175 දැව හා ගල් මුද්‍රා වෙනුවට මැටිවලින් අච්චු අකුරු නිපදවා ඒ ආශ්‍රයෙන් පිටපත් රැසක් ගබඩාකර ගැනීමට චීනුන්ට හැකිවිය. පසුව ඔහුන් විසින්ම ක්‍රි.ව.200 මැටි අච්චු අකුරු වෙනුවට ලී අච්චු මත අක්ෂර කපා ස්වකීය මුද්‍රණ කටයුතු සඳහා භාවිත කරන ලදි. මෙම තාක්ෂණය වසර 900කට ආසන්න කාලයක් චීනයේ පැවති අතර පසුව එය ක්‍රි.ව. 610 කොරියාවට ද ක්‍රි.ව. 625 ජපානයටද කඩදාසි නිපදවීමේ තාක්ෂණයත් සමග පැතිර ගියේය. මීළඟට පී ෂෙන්ග් (pe sheang) නැමැත්තා විසින් ලෝකයාට මාරු කළ හැකි මැටි අච්චු අකුරු (Movable type) ක්‍රමය දායාද කළ අතර කල්යාමේ දී එයද මාරු කළ හැකි ලී අකුරු දක්වා දියුණු කළ බව පෙනේ. එහි තාක්ෂණික අංශය සංවර්ධනය කල බුද්ධිමත් කොරියානුවන් විසින් ක්‍රි.ව. 1234 චලනය කළ හැකි ලෝහමය අක්ෂර (Movable Metal type) ක්‍රමය හඳුන්වා දෙන ලදි (කළුආරච්චි, 204:16). පොදුවේ චීන, ජපන්, කොරියානු මුද්‍රණකරුවන් පිටපත් ගැනීමේ දී ජලයෙන් මිශ්‍රත තීන්ත වර්ග ප්‍රයෝජනයට ගත්හ. අපරදිග මුද්‍රණකරුවෝ ඒ සඳහා ප්‍රයෝජනයට ගත්තේ තෙල් මිශ්‍රිත තීන්ත වර්ගය. ජපානය, සියම, කාම්බෝජය, මියන්මාරය, කොරියාව යන රටවලද පුස්තකාල පැවතින. තව ද ඉන්දුනීසියාවේ ශ්‍රී විජය අධිරාජ්‍යයේ ද පුස්තකාල පැවතින. මැද පෙරදිග නැගෙනහිරෙන් අනතුරුව. ලෝකයේ පැරණිතම පුස්තකාල හමුවන්නේ දකුණු ආසියාවෙනි. පැරණි ඉන්දියාවේ පැවති පුස්තකාල සරස්වතී භාණ්ඩාගාර නමින් හැඳින්විනි. ක්‍රි. ව. 675 නාලන්දා, වික්‍රමශීලා. වලභි යන බෞද්ධ විශ්වවිද්‍යාල වල දියුණු පුස්තකාල සේවයක් තිබී ඇත. නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය ධර්ම ගඥ්ඥ ලෙස හඳුන්වා තිබෙන අතර එහි ස්ථාපිතව පවතින පුස්තකාල,

රතනසාර

රතන දෝයි

රතන රංජනයනාදී වශයෙන් තිබේ. විශේෂයෙන් චීනයෙන් පැමිණි ෆාහියන් හියුංසාන් යනාදි බෞද්ධ භික්ෂූන් නාලන්දාවේ වසර 10ක කාලයක් අධ්‍යාපනය හදාරා ශ්ලෝක 500 000 සමන්විත ධර්ම ග්‍රන්ථ 400 චීනයට ගෙන ගිය බව ඉතිහාසයේ සඳහන්වෙයි (වීරසිංහ, 2001:42). නාලන්දා පුස්තකාලයේ බෞද්ධ දර්ශනය හා ආගම්,

තාරකා විද්‍යාව

වෛද්‍ය විද්‍යාව

ගුප්ත ශාස්ත්‍රය

ව්‍යාකරන සහ ප්‍රාචීන භාෂාවන්ට අයත් ලේඛන සුරක්ෂිත කොට පැවතින.මෙම අගනා පුස්තකාලය ක්‍රි.ව. 13 භකිතියාර් බල්ජ් මුස්ලිම් ආක්‍රමනිකයා විසින් විනාශ කරන ලදි. මීට අමතර දකුණ ඉන්දියාවේ කැම්බේ සහ තන්ජොරයේ පිටපත් 30000 යුත් පුස්තකාල පැවති අතරව ආසියාතික පුස්තකාල ක්‍රමයේ ඉතිහාසය විමසා බැලීමේදී ශ්‍රී ලංකාවට ද සුවිශේෂි ස්ථානයක් හිමිවෙයි.ශ්‍රී ලාංකේය පුස්තකාල ක්‍රමය පොත්ගුල් සම්ප්‍රදාය නමින් හැඳින්වෙයි. බොහෝ විද්වතුන් මෙරට සාක්ෂරතාව සහ පුස්තකාල ක්‍රමයේ ආරම්භය මහින්දාගමනයට සමපාත කළ ද යටත් පිරිසෙයින් ක්‍රි.පූ 800-500 අතර යකඩ යුගයේ දිවෙන මෙරට පුස්තකාල ක්‍රමයක් සුලුවෙන් හෝ පැවති බව අනුරාධපුර ඇතුළු නුවර කැනීම්වලින් හමුවුන

බියා අනුරධි- තයා කුටේ

යන වාක්‍ය ඇතුළත් මැටි පාත්‍රා කැබැල්ලෙන් සහ පුස්තකාල පොත් කම්භ කැබැල්ලෙන් මොනවට පැහැදිලි වෙයි. එහෙත් මෙරට සංවිධානාත්මක පුස්තකාලයක් අඩිතාලමට වැටෙන බව මහින්දාගමනය සහ දුමින්දාගමනයෙනි. මෙරට පොත්ගුල් අනුග්‍රහය පළකළ රජවරු අතර,

| | | | | |
|---|---|---|---|---|
| ලන්ඩන් | හාවර්ඩ් | මැසචුසෙන්ට් | මෝනැෂ් | බීජින් |
| කේම්බ්‍රිජ් | ප්‍රින්ස්ටන් | ටෝකියෝ | දිල්ලි | කැන්බරා |
| ඔක්ස්ෆර්ඩ් | චිකාගෝ | ෂුකුටෝකු | මද්‍රාසි | බ්‍රසීලියා |
| සොබෝන් | නිව්යෝර්ක් | කොයිමබ්‍රා | වූහාන් | පාඩුවා |
| ලිස්බන් | මැඩ්රිඩ් | බර්ලින් | ලෙනින්ග්‍රාඩ් | මොස්කව් |

කැපී පෙනේ. ඔවුන් විසින් පොත්ගුල් සංවර්ධනය කරීමට රාජ්‍යානුග්‍රහය නොපැකිලිවම ලබා දෙන ලදි. විශේෂයෙන් මහාපරාක්‍රමබාහු. රුහුණේ සහ පොළොන්නරුවේ පුස්තකාල 130 ක් පිහිටුවා තිබේ. එසේ ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් හෙතෙම නිත්තවේල විහාරය, දෙගල්දොරුව, ගංගාරාමය, සූරිය ගොඩ, නියමකන්ද යන ස්ථානවල වැලිවිට අසරණ සරණ සරණංකර හිමිගේ උපදේශකත්වයෙන් පොත් ගුල් විහාරය ගොඩනංවන ලදි. මෙම පුස්තකාල බොහෝමය වර්තමානයේ දැකිය හැකි ය.

**නිගමනය**

මෙම කරුණුවලට අනුව ලොව පැරණි පුස්තකාල අතර ආසියාතික පුස්තකාල ක්‍රමයෙ සුවිශේෂි ස්ථානයක් හිමි වන බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** කඩදාසි, පුස්තකාලය, මානව දැනුම, මැටි පුවරු ලිපි, මුද්‍රණ ක්‍රම

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගුණසේකර, ධනපාල (1998). *පුස්තකාල සේවාවේ ද මූලිකාංග*, කොළඹඃ එස්. ගොඩගේ සහෝදරයෝ.

මුතුකුඩ. ජූඩ් ජයසුන්දර, මෛත්‍රී (2014). *පුස්තකාල හා විඥාපනවිද්‍යාව.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර (2005). *පුස්තකාල සහ විශ්ව දැනුම*, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසිංහ. ඩබ්ලිව්. එම්. කේ (2001). *පුස්තකාල ඉතිහාසය.* කැලණියඃ කර්තෘ ප්‍රකාශනයකි.

සමරකෝන්, අබේරත්න (2001). ඉගෙනුම පුස්තකාලය. ජා ඇලඃ සමන්ති ප්‍රකාශකයෝ.

හේරත් ඉසුරු (2020). පුස්තකාල විද්‍යාවට බලපෑ අතීත පිය සටහන්. මහනුවරඃ කර්තෘ ප්‍රකාශයකි.